ශ්‍රී ලාංකිකයින් මිලියන ගණනකට ඩිජිටල් අවකාශයේ
හෙළ අකුරින් තම ආත්ම ප්‍රකාශනයන් රචනා කිරීමට ඉඩ සලසන
හෙළකුරු ඩිජිටල් සිංහල යතුරුපුවරුවේ
ලිනක්ස් සංස්කරණය

# ලිනක්ස් සඳහා හෙළකුරු

## උපදෙස් මාලාව

Bhasha

© 2018 භාෂා ලංකා (පුද්) සමාගම
https://www.bhasha.lk | 034 2040600 | support@bhasha.lk

# ස්ථාපනය සඳහා උපදෙස්

1. https://www.helakuru.lk වෙබ් අඩවිය වෙත පිවිස ලිනක්ස් සඳහා හෙළකුරු සංස්කරණය ඩවුන්ලෝඩ් කරගන්න.

2. ඩවුන්ලෝඩ් කරගත් ZIP ගොනුව දිගහැර හෙළකුරු ස්ථාපනය කිරීම සඳහා helakuru.deb අයිකනය ඩබල් ක්ලික් කරන්න.




3. ස්ථාපනය ඇරඹීම සඳහා ඊළඟට දිස්වන කොටුවෙන් Install ඔබන්න.




4. ස්ථාපනය නිමා වූ පසු Exit ඔබා එතනින් ඉවත් වන්න.

5. ස්ථාපනය සම්පූර්ණ කිරීමට පරිගණකය නැවත ආරම්භ කරන්න (Restart).

6. පරිගණකය නැවත ආරම්භ වූ පසු මෙහෙයුම් පද්ධතියේ Settings වෙත පිවිස Region & Language තෝරන්න.




7. ඉහත රූපයේ පරිදි + බොත්තම ඔබා සිංහල භාෂාවට අයත් යතුරුපුවරු සැලැස්මට යන්න.



8. එහි ඔබ කැමති සිංහල රචනා කරන ක්‍රමවේදය (හෝ ක්‍රමවේදයන්) පහත පරිදි එකතු කරගන්න.

- ශබ්දානුකූල රචනය සඳහා helakuru-phonetic
- සම්මත විජේසේකර රචනය සඳහා helakuru-wijesekara




9. ඔබ එකතු කරගත් ක්‍රමවේදයන් පහත පරිදි දිස්වේ.




10. Settings වලින් ඉවත්වන්න. දැන් ඔබ හෙළකුරු සකසා අවසන්. සිංහල රචනය සඳහා මීළඟට දක්වා ඇති භාවිතය සඳහා උපදෙස් කියවන්න.

# භාවිතය සඳහා උපදෙස්

1. සිංහල රචනය සඳහා පරිගණකයේ යතුරුපුවරු භාෂාව වෙනස් කරන අයිකනය ඔබා Sinhala (helakuru-phonetic) හෝ Sinhala (helakuru-wijesekara) තෝරාගන්න.




2. දැන් ඔබේ යතුරුපුවරුවෙන් සිංහල රචනය අරඹන්න.